# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ජපන්/කොරියන්/ප්‍රංශ/චීන/හින්දි භාෂා පාඨමාලා - 2020

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් 2020 වර්ෂයේ පැවැත්වීමට නියමිත පහත සඳහන් පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයන්ගෙන් 2020.08.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. ජපන් / කොරියන් / ප්‍රංශ / චීන හා හින්දි යනාදි භාෂා පාඨමාලා වල සහතික පත්‍ර/උසස් සහතික පත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා

## පාඨමාලා ගාස්තු :-

| | |
|---|---|
| සහතික පත්‍ර පාඨමාලාව | - රු. 20,000/- |
| උසස් සහතික පත්‍ර පාඨමාලාව | - රු. 25,000/- |
| ඩිප්ලෝමා පාඨමාලාව | - රු. 31,000/- |

සැ.යු. (පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී විශ්වවිද්‍යාලය වෙත ගෙවූ කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.)

## ලියාපදිංචිය සඳහා සුදුසුකම් :-

### සහතික පත්‍ර පාඨමාලාව

- වයස අවුරුදු 17 සම්පූර්ණ කළ මෙම පාඨමාලා ඉගෙනීමට උනන්දුවක් දක්වන අය.

### උසස් සහතික පත්‍ර පාඨමාලාව

- අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත් වීම සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සමත්වීම.

### ඩිප්ලෝමා පාඨමාලාව

**SLQF Level 3-30 Credits**

- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අදාළ විෂය සමඟ සමත්වීම සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් 70% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා සමත්වීම.

### මෙම පාඨමාලාවන් සඳහා ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය:

ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය 2020-09-05 දින පැවැත්වේ. මෙම පරීක්ෂණයේ දී දක්වන කුසලතාව මත සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

### පාඨමාලා ආරම්භය/ දේශන පැවැත්වීම.

පාඨමාලා 2020-09-12 මස ආරම්භ වේ. දේශන සති අන්ත දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 1.30 දක්වා කොළඹ දී පැවැත්වේ.

### පාඨමාලා කාල සීමාව : අවුරුදු 01

එක් එක් පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සිසුන් නොමැති අවස්ථාවක දී එකී පාඨමාලාව නොපැවැත්වෙන බව සැලකිය යුතුය.

### අයදුම්පත් ලබාගත හැකි ආකාරය :

තැපැල් මගින් අයදුම්පත් ලබා ගන්නේ නම් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 711202, දරන ගිණුමට බැර වන පරිදි රු.500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමඟ නම, ලිපිනය ලියන ලද 9"4" ප්‍රමාණයේ රු. 15/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය. නැතිනම් මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ සරප් වෙත අදාළ ගාස්තු ගෙවා ලබා ගන්නා ලද ලදුපත 2020.08.25 දින දක්වා සතියේ වැඩකරන දිනවල ප.ව. 3.00 ට පෙර ඉදිරිපත් කිරීමෙන් අයදුම්පත් හා විස්තර ලබා ගත හැකි ය.

අන්තර්ජාලයේ www.bpu.ac.lk/admissions/external දරන වෙබ් අඩවියට පිවිස අයදුම්පත් ලබාගත හැකි අතර එම ලබාගන්නා අයදුම්පත සමඟ හෝමාගම ලංකා බැංකුවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 711202 දරන ගිණුමට බැර වන පරිදි රු.500ක් ගෙවා ලබාගත් රිසිට්පත සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත දිනට පෙර එවිය යුතුය.

චෙක් පත් හෝ තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ. නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේදී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ ඉදිරියෙන් "**Other**" යන සංකේත අංකය ද සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.08.28 වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් උක්ත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩි විස්තරඃ 011-2593604, 2502944

පාඨමාලා සමායෝජක ඃ 0718444916

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
214 , බෞද්ධාලෝක මාවත, කොළඹ 07
2020-07-20